යටියන්තොට ප්‍රාදේශීය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය

..........................................

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවක ඇප තැන්පත් රු. 58,447 ක් සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලින් හෙළිදරව්කර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය 2014 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ වල පිරිවැයේ එකතුව ට සමාන වියයුතු වුවත් එම ශේෂයන් දෙක අතර රු. 4,007,591 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ජල සැපයුම් ණයහිමි ශේෂය රු.312,791 ක් වුවද ගිණුම්වල එය රු. 31,291 ක් ලෙස දැක්වීම නිසා රු.281,500 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) බැහැර කර තිබූ එකතුව රු.345,300 ක්වූ වත්කම් විෂයයන් 06 ක් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ රු.112,500 ක් වැය කර ඉදිකළ ඉහල ගරාගොඩ සුසානාගාරය හා පොදු වෙළඳපලකඩකාමර වෙනුවෙන් වැයකළ 31,937 ක් වශයෙන් එකතුව රු.144,437 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ අදායම් රු.365,525 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට වැඩිපුර ගෙවා තිබුණු විශ්‍රාම වැටුප් පාරිතෝෂිත මුදල රු.37,874 ක් සම්බන්ධයෙන් ගිණුම් වල ගැලපීම් කර නොතිබුණි.

(ඌ) සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු රු. 6,900 හා රථවාහන අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවිය යුතු වූ රු.536,422 ක වියදම් ණයහිමියන් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඒ) දේශීය ණය හා සංවර්ධණ අරමුදල් ණය යටතේ ඉදිකරන ලද ආදාහනාගාරය වෙනුවෙන් ගෙවිය යුතු වූ රු.1,900,000 ක බැරකම් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඔ) මූල්‍ය ප්‍රකාශන අනුව මුළු වත්කම් හි එකතුව රු.112,104,887 ක් වූ අතර මුළු බැරකම්හි වටිනාකම රු.114,252,514 විය. ඒ අනුව රු.2,147,627 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) සමාලෝචිත වර්ෂයට අදාල රු.144,933 ක් වූ වියදම් ණයහිමියන් ගිණුම්ගත කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහන් මඟින් විශ්ලේෂණය කරමින් ඉදිරිපත් කර තිබුණු ආදායම් වියදම් ගිණුමේ පෙර වර්ෂ ගිණුම් ශේෂයන් දක්වා නොතිබුණි. ආදායම් වියදම් ගිණුමේ,ආදායම් විෂයයන් සහ වැය විෂයයන් 13 සඳහන් සංඛ්‍යාවන්, ගිණුමට ලබාදී තිබුණු සටහනේ ශේෂයන් සමඟ සැසඳීමේදී රු.14,118,393 වෙනසක් හා ශේෂ පත්‍රය සඳහා ඉදිරිපත් කර තිබුණු ගිණුම් සටහනක රු.7,366 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 <u>නොසැසඳුන පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 09 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.123,943,208 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.121,663,196 ක් වූයෙන් රු.2,280,012 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 <u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>

1996 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලයට අදාල වටිනාකම රු. 1,024,562 ක කල් ඉකුත්වූ තැන්පත් 68 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,300,600 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු1,499,219ක් වූ යෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.801,381 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

ලේකම්වරිය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2014.01.01 දිනට හිඟය | 2014.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2014.12.31 දිනට හිඟය<br>2014.01.01 දිනට පැවති ශේෂයන් | වර්ෂයේ බිල් කිරීම් වලින් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| iවරිපනම් හා බදු | 1,654 | 282 | 3,709 | 2,668 | 1,372 | 1,041 | 1,413 |
| ii බදු කුලී | 113 | 38 | 3,995 | 3,420 | 75 | 575 | 650 |
| iiiවෙනත් ආදායම් | - | | 167 | 99 | - | 68 | 68 |

2.2.2 බදු කුලී
------------

යටියන්තොට ඉන්ධන පිරවුම් හල පිහිටි ඉඩම 2011 ඔක්තෝබර් 15 දින සිට 2014 ඔක්තෝබර් 14 දින දක්වා ගිවිසුමකට එළඹීමෙන් තොරව ලංකා ඛනිජතෙල් සංස්ථාවට බද්දට දී තිබුණ අතර, ඒ සඳහා අයවිය යුතු රු. 147,460 ක් 2014 දෙසැම්බර් මස විගණන අවස්ථාව දක්වාම අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2015 මැයි 20 දින වන විට කාර්ය මණ්ඩල තොරතුරු අනුව අනුමත තනතුරු 85 න් ,තනතුරු 41 ක් පුරප්පාඩු වී තිබුණි. මෙය අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 48% ක් විය.

(ආ) අනුමත පුරප්පාඩු සංඛ්‍යාව සපුරා ගැනීමට කටයුතු නොකර සේවා ගිවිසුම්මත බදවාගත් සේවකයින් සඳහා කාර්යාලීය කටයුතු පවරා තිබුණි. 2012 වර්ෂය සිට 2015 මාර්තු දක්වා සේවකයන් 24 දෙනෙක් යොදවාගෙන ඔවුන් සඳහා රු. 2,924,013 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් මස 31 දිනට රු.365,740 ක අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි.

(ඈ) වැටුප් රහිත නිවාඩු සඳහා 2012 සහ 2013 වර්ෂයන්හිදි අයකරගත යුතු රු. 487,437 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දීර්ඝ කාලයක සිට පැවත එන ස්ථාන මාරුලැබ ගිය නිලධාරින් දෙදෙනෙකුගේ අයකර ගත යුතු රු. 61,300 ක ශේෂයක් සහ සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසයේ සේවය හැර ගිය එක් නිලධාරියකගෙන් අයකර ගත යුතු රු.5000 ක මුදලක් ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය අංශයේ කම්කරුවන් වෙනුවෙන් ඉදිකළ නිවාස 06 ක 2010 මාර්තු 08 දින සිට සභාවේ කම්කරුවන් 06 දෙනෙකු පදිංචිව තිබුණි. ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 5 වැනි ඡේදය ප්‍රකාරව සේවකයින්ගේ මූලික වැටුපෙන් 12 ½ % බැගින් ගණනය කළ කුලී මුදලක් අයකර ගත යුතුව තිබුණු බැවින් 2014 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු නිවාස කුලිය රු.483,632 ක් විය.

3.3 <u>ආර්ථික නොවූ වියදම්</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) යෝජිත යටියන්තොට නගරය අලංකරණ සැළැස්ම වෙනුවෙන් මිනුම්දෝරු සැළැස්ම පිළියෙල කිරීම සඳහා 2014 මාර්තු 20 දින රු. 550,000 ක් සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි. එහෙත් 2015 මැයි 21 දින දක්වාම කිසිදු සංවර්ධන සැළැස්මක ආරම්භයක් නොතිබු අතර, සකස් කරන ලද මිනුම්දෝරු සැළැස්ම නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමකින්ද තොරව සභාවේ රඳවාගෙන තිබුණි.

(ආ) 1996 වර්ෂයේ සිට යටියන්තොට වීඔය 4 කණුව ප්‍රදේශයේ පවත්වාගෙන ගිය ගල්වලක් සඳහා 2011 ජනවාරි 07 සිට 2014 ජනවාරි 06 දින දක්වා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාදී තිබියදී හිටපු සභාපතිවරයා විසින් 2013 වර්ෂය සඳහා වෙළද බලපත්‍රය ලබා නොදීම නිසා ගල්වලේ හිමිකරු විසින් නඩු පවරා තිබුණි, අධිකරණයේදී සභාව විසින් වෙළද බලපත්‍රය නිකුත් නොකිරීමට කිසිදු සාධාරණ හේතුවක් නොමැති බව පෙන්වා දී නඩුව අවසන්කර තිබු අතර්, සභාව විසින් නීතිඥ ගාස්තු සඳහා රු.75,000 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) අවිස්සාවේල්ල දිසා අධිකරණයේ නඩු අංක 22825 යටතේ පුද්ගලයන් කීපදෙනෙකු අතර පැවති ඉඩම් ආරවුලක් සම්බන්ධ නඩුවක් සඳහා අවසන් වග උත්තරකරු ලෙස යටියන්තොට ප්‍රාදේශීය සභාව නම්කර තිබුණි. මේ සඳහා රාජ්‍ය නිලධාරියෙකු ලෙස කරුණු කීමට සභාවේ නිලධාරියෙකු ඉදිරිපත් කිරීමට හැකියාව තිබියදී නඩුව සඳහා කරුණු කීමට නීතිඥවරයෙකු ඉදිරිපත් කිරීම නිසා රු. 45,000 ක් සභා අරමුදලින් ගෙවීමට සිදුවී තිබුණි.

(ඈ) සභාව සතු එස්ජී.ජීකේ-0627 දරන කැබ්රථය රු.936,421 ක් වැයකර පූර්ණ අළුත්වැඩියාවකින් පසුව 2013 ජූලි 30 දින සභාව වෙත රැගෙනවිත් තිබියදීත් 2013 ජූලි 30 දින සිට 2014 දෙසැම්බර් 07 දින දක්වා කුලී වාහනයක් භාවිතා කර තිබුණු අතර,මේ සඳහා ගිවිසුමකට එළඹ නොතිබියදී හා ධාවන විස්තර කිසිවක් නොමැතිව එකතුව රු.1,530,000 ක් ගෙවීම්කර තිබුණි.

(ඉ) ගලිබවුසරය ප්‍රවාහනය කිරිමට යොදවා ගෙන ඇති ට්‍රැක්ටරයට 2014 මාර්තු 03 දින සිට 2015 අප්‍රේල් 11 දින දක්වා රු.88,270 ක් වැය කර ඩීසල් ලීටර් 809 ක් යොදා තිබුණු බැවින් දළ වශයෙන් කි.මී.6,472 ක් පමණ ධාවනය කළ යුතුව තිබුණි. එහෙත් ඉහත කාලපරිච්ඡේදය තුළ අවස්ථා 10 කදී කි.මී. 112 ක් පමණක් ධාවනය කර තිබු හෙයින් ලබාගත් ඉන්ධන එම වාහනය සහා යොදාගෙන ඇත්දැයි පිළිගත හැකි කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය .

(ඊ) කොම්පෝස්ට් ව්‍යාපෘතියේ බොබ් කැට් යන්ත්‍රය සඳහා 2014 ජනවාරි 07 දින සිට 2015 අප්‍රේල් 20 දින දක්වා එකතුව රු. 283,096 ක් වටිනාකමැති ඩීසල් ලීටර් 2,482 ක් මිලදී ගෙන තිබුණි. ලබාගත් ඉන්ධන අදාල යන්ත්‍රය සඳහා යෙදූ බවට හා එම යන්ත්‍රය ක්‍රියාකළ බවට කිසිදු පිළිගත හැකි සාක්ෂියක් ඉදිරිපත් නොවුණි

(උ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 16 වන වගන්තිය අනුව කිසියම් මාසයක් සඳහා ගෙවිය යුතු දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දිනට කලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු වුවත්, එසේ නොගෙවීම හේතුවෙන් දඩ මුදල් ලෙස රු.41,017 ක් ගෙවිමට සිදු වී තිබුණි.

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය</u>

1988 මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 <u>අයවැය පාලනය</u>

අයවැය මූල්‍ය පාලන උපකරණයක් ලෙස භාවිතා කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන වෙන්කර තිබූ වැය විෂයන් 52 ක එකතුව රු. 6,128,670 ක ප්‍රතිපාදන 100% ක් ද වැය විෂයන් 17 ක එකතුව රු. 2,105,322 ක ප්‍රතිපාදන 62% - 99% අතර ප්‍රමාණයක් යොදවාගෙන නොතිබුණි.

5. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය